

# සංචාරයකට ආ ඕස්ට්‍රේලියානු යුවළ මෙරට දරුවන් ක්‍රිකට් පුහුණු වෙන හැටි දැක සංවේදී වෙයි...!

## නැවත මව් රටට ගිය ඔවුන්ගෙන් මෙරට දරුවන්ට තෑගි කන්දක්..!



**පසුගිය වසරේ ඕස්ට්‍රේලියාවේ වෙසෙන මා මිත්‍ර Aaron Dragwidge සහ ඔහුගේ බිරිඳ වන Kerry Dragwidge ශ්‍රී ලංකාවේ සංචාරයකට ගොස් මෙරට දරුවන් ඉතා අඩු පහසුකම් යටතේ ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවන ආකාර දැක ඔවුන්ට උදව් කළ වටිනා අවස්ථාවක් මෙසේ සටහන් කරමි .**

මොවුන් ශ්‍රී ලාංකික දරුවන් වෙනුවෙන්



සපත්තු 1,403 ක්, ළමා ක්‍රිකට් කට්ටල 200 ක්, ආරක්ෂිත ක්‍රිකට් ක්‍රීඩා උපකරණ ඇතුළු බොහෝ දේ ලබා දීමට කටයුතු කර තිබුණා.එම යුවළ ශ්‍රී ලංකාවේ හිටපු දක්ෂ දඟ පන්දු ක්‍රීඩකයෙක් වන සුරන්ජිත් සිල්වාගේ ඉල්ලීමක් මත මොරටුවේ පවත්වාගෙන යන Cricket Live Foundation ආයතනයට පැමිණි අවස්ථාවේ මෙරට දරුවන් ඉතා අඩු පහසුකම් යටතේ ක්‍රිකට්



ක්‍රීඩාව පුහුණු වන ආකාරය දැක ඉතා සංවේදී වී ඇති අතර නැවත ඕස්ට්‍රේලියාවට ගොස් ශ්‍රී ලාංකික දරුවන් වෙනුවෙන් උපකාර කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට තීරණය කර තිබුනා.

ඒ අනුව සිය සංචාරය නිමා කර නැවත

දරුවන්ගේද සහය ලබා ගෙන ඇති අතර සිය සමාජ ජාලා වෙබ් අඩවි මඟින් මිතුරන්ගේ සහයද ඉල්ලා තිබුණා. එහි ප්‍රතිඵලයක් ලෙස ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හී Mount Waverley Secondary Collage පාසැල් සිසු දරුවන්

ඕස්ට්‍රේලියාවට ගිය එම යුවළ මෙරට දරුවන්ට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට කටයුතු කර තිබුනා. එහිදී Kerry Dragwidge සේවය කරනා පාසලේ

ඇතුළු තවත් පාසැල් ගණනාවක සිසුදරුවන් ,මෙල්බර්න් ''ට්‍රයිකෝ'' ආයතනයේ අධිපති යසන්ත ඩයස් (Yasantha Dias) නවීන් ආසිරි ප්‍රනාන්දු Naveen Asiri

Fernando ශ්‍රී ලංකාවේ ජා- ඇල නගර සභික ඇන්ටන් ප්‍රනාන්දු සහ විජය , ජූඩ්, කැලුම් පෙරේරා යන අයද විශාල සහයක් ලබා දුන් අතර මේ සැමගේ උපකාර මුල් කරගෙන අදාළ ක්‍රීඩා උපකරණ සහ පාවහන් මොරටුවේ Cricket Live Foundation,මොනරාගල ,බදුල්ල දික්වැල්ල වැනි අත දුෂ්කර පාසැල් දරුවන් ගණනාවකට ලබා දීමට කටයුතු කර මා හට හැකි වුනා.

**ඉදිරියේදීත් Aaron සහ ඔහුගේ බිරිඳ Kerry මෙලෙස ක්‍රීඩා උපකරණ ලබා දීමට පොරොන්දු වුනා.**

**වර්නන් තිසේරා**







